**ඒකාබද්ධ රියදුරු සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා ඉල්ලුම්පත් කැඳවීම.**

1. ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ පවතින රියදුරු සේවයේ III ශ්‍රේණියේ පුරප්පාඩු සඳහා නිලධරයන් බඳවා ගැනීමට කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 03/2014 යටත්ව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ 2014.08.15 දිනැති අංක 1875/39 අනුමැතිය ප්‍රකාරව අයදුම්පත් කැඳවනු ලැබේ.

2. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල අනුව කුසලතාව මත සුදුසුකම් සපුරා ඇති අපෙක්ෂකයන්, පවතින පුරප්පාඩු සඳහා පත් කරනු ඇත.

3. ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු සංඛ්‍යාව 1 කි. පත්වීම් ලබන්නා පත්වීම ක්‍රියාත්මක වන දිනය පත්වීම් බලධරයා විසින් නිශ්චය කරනු ලැබේ.

4. වැටුප :- අංක 03/2016 හා 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව, රියදුරු සේවයේ III වන ශ්‍රේණියට අදාළ මාසික වැටුප් පරිමාණය (PL3- 2016) ඒ රු. 25,790/= 10x270/- 10x300/- 10x330/- 12x350/- රු. 38,990/- වේ. රු. 28,790/= න් ඔබ්බට යාම සඳහා II වන ශ්‍රේණියට උසස් වීම ද රු. 31,820/- න් ඔබ්බට යැම සඳහා I වන ශ්‍රේණියට උසස් වීම ද රු. 35,140/- ඔබ්බට යැම සඳහා විශේෂ ශ්‍රේණියට උසස් වීමද ලබා ගත යුතුය. එම චක්‍රලේඛයේ II වන උපලේඛනයේ සඳහන් පරිදි ගෙවීම් සිදු කරනු ලැබේ.

5. තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට නිලධාරීන් යටත් විය යුතු වේ. පළමු පත්වීම ලැබූ සේවා ස්ථානයේ අවම වශයෙන් වසර 03 ක් අනිවාර්යයෙන්ම සේවය කළ යුතුය. කෙසේ වෙතත් පත්කිරීම් බලධාරියා විසින් තීරණය කරනු ලබන යම් සුවිශේෂී හේතූන් මත එම කාලය අවසන් වීමට පෙර යම් නම්, පත්කිරීම් බලධරයා හට ඒ සඳහා බලය ඇත.

6. සුදුසුකම් :

6.1. අධ්‍යාපන සුදුසුකම්

අධ්‍යයනය පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සිංහල / දෙමළ භාෂාව ඇතුළුව සම්මාන දෙකක් සහිතව විෂයන් හයක් සමත්වී තිබීම.

7. වෘත්තීය සුදුසුකම් :

7.1 පෞද්ගලික/කුලී රථ සහ තාර බර හොණ්ඩර 24 ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම. (බඳවා ගන්නා දිනට වසර තුනක (03) ට පෙර අවම වශයෙන් සී සහ සී1 වාහන පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව බී පන්තියේ බලපත්‍රය ලබා සිටිය යුතු ය).

7.2 මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳව මනා දැනුමක් තිබිය යුතු ය.

8. පළපුරුද්ද :

වාහන රියදුරකු වශයෙන් වසර තුනක පළපුරුද්දක් තිබිය යුතු ය. ) පළපුරුද්ද සහතික මඟින් සනාථ කළ යුතු ය.)

9. කායික සුදුසුකම් :

අවම උස අඩි 05ක් විය යුතු ය.

දිවා කාලයේ සහ රාත්‍රී කාලයේ දී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්ත්වයක සිටිය යුතු, අතර මනා ඇස් පෙනීමක් තිබිය යුතු ය. රජයේ වෛද්‍ය නිලධාරියකු විසින් නිකුත් කරන ලද විධිමත් සහතිකයක් මඟින් ඒ බව සනාථ කළ යුතු ය.

10. වෙනත් සුදුසුකම් :

10.1 ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

10.2 අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.

10.3 තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය 6,7, 8, 9, 10, සහ 11 හි සඳහන් සියළුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

11. වයස :

11.1 අවම සීමාව : අවුරුදු 18ට නොඅඩු

11.2 උපරිම සීමාව : අවුරුදු 45ට නොවැඩි